# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,484 - 2026 අප්‍රේල් මස 10 සිකුරාදා - 2026.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 136 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 139 |

සැ. යු. - (i) අල්-හෂිමි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මාස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

135 - B 082781 - (2026/04)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.09.20 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 52734 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 280, කු. ග. 18, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර හි පදිංචි හතරසිංහ ආරච්චිගේ පියදාස ඒකනායක වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/312/4883/2000 යටතේ 2000.12.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ /කෝරළේ කරඹවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර - කු. ග. 18 නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති අංක 280 (නිවාස) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අභ්‍යන්තර මාර්ගය,
*නැගෙනහිරට* : අභ්‍යන්තර මාර්ගය,
*දකුණට* : අංක 279 නිවාස ඉඩම,
*බස්නාහිරට* : අභ්‍යන්තර මාර්ගය.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2026 ජනවාරි මස 16 වැනි දින.

04-165/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.05.20 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 52053 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ලුණුගම්වෙහෙර, දකුණු ඉවුර, කුඩා ගම් 05, අංක 211 පදිංචි අංගප්පුලිගේ සාමෙල් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/309/3045/99 යටතේ 1999.08.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ/කෝරළේ ඉත්තන්වැකඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර, කුඩා ගම්මාන 05 නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති අංක 211 නිවාස දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අංක 170 නිවාස ඉඩම,
*නැගෙනහිරට* : අංක 210 නිවාස ඉඩම,
*දකුණට* : අතුරු පාර,
*බස්නාහිරට* : අංක 212 නිවාස ඉඩම.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2026 ජනවාරි මස 06 වැනි දින.

04-165/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.06 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 39402 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 303, කු. ග. 18, දකුණු ඉවුර, වීරවිල නව නගරය හි පදිංචි නම්බුකාර ගමගේ සිරිතුංග වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/1610/98 යටතේ 1998.06.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ /කෝරළේ කරඹවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර - කු. ග. 18 නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ අංක 303 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අංක 304 ඉඩම හා අභ්‍යන්තර පිවිසුම් මහ,
*නැගෙනහිරට* : අංක 302 ඉඩම,
*දකුණට* : අංක 302 ඉඩම හා මහ ඇළ රක්ෂිතය,
*බස්නාහිරට* : අංක 304 ඉඩම.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2026 පෙබරවාරි මස 26 වැනි දින.

04-165/3

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.18 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 44529 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 304, කු. ග. 18., දකුණු ඉවුර, වීරවිල නව නගරය හි පදිංචි ටිකිරා හැන්නදිගේ පියසීලී වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/1663/98 යටතේ 1998.06.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනු ප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන උපවගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ / කෝරළේ කරඹවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර - කු. ග. 18 නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ අංක 304 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 02 පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අභ්‍යන්තර පිවිසුම් මහ,
*නැගෙනහිරට* : අංක 303 ඉඩම,
*දකුණට* : අංක 303 ඉඩම හා මහ ඇළ රක්ෂිතය,
*බස්නාහිරට* : අංක 305 ඉඩම.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2026 පෙබරවාරි මස 26 වැනි දින.

04-165/4

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 දෙසැම්බර් 16 වන දින ප්‍රදානය කර ඇති අංක හම්/7/ප්‍ර 28136 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මිද්දෙනිය නැගෙනහිර පදිංචි මුණසිංහ ආරච්චිගේ සරත්විජයානන්ද වෙත ප්‍රදානය කොට පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු ගිරුවා පත්තුවේ මිද්දෙනිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුඩගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කටුවන ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක හ/90/026 එන් දරන කට්ටි කැබිලි පිඹුරේ අවසාන ගම් පිඹුරු අංක 402 දරන රේඛා සටහනේ අංක 157 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.100 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : (මිද්දෙනිය සමූහ ගොවිපොළ ඉඩම)

| | |
|---|---|
| *උතුරට* | : අංක 148 ද, |
| *නැගෙනහිරට* | : අංක 156 ද, |
| *දකුණට* | : මාර්ගය ද, |
| *බස්නාහිරට* | : අංක 158 ද වේ. |

ආර්. ඒ. චතුරි දිමිත්‍රා,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2025 දෙසැම්බර් මස 16 වැනි දින.

04-165/5

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (අන්තර් පළාත්) ඩී. එම්. එස්. දසනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.07.20 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 08748 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අගාරේ මා එළිය පදිංචි බස්නායක මුදියන්සේලාගේ කළු බණ්ඩා වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක B 114/732/90 යටතේ 1990.05.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.05.01 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිරියාල/දිවිගන්දහය පත්තුවේ/කෝරළේ 373 අගාරේ (83-මාඑළිය) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අගාරේ නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 02 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 1962 දරන කට්ටි කැබිලි පිඹුරේ අංක 65 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන්/අක්කර 02, විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ඇලබොඩයාය

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 02, 1/2 සහ මා එළිය ගම්මානය, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 63, |
| *දකුණට* | : කැබලි අංක 66, |
| *බස්නාහිරට* | : කැබලි අංක 45 2/2. |

ඩී. එම්. එස්. දසනායක,
ප්‍රදේශීය ලේකම්,
පොල්පිතිගම.

2025 මැයි මස 23 වැනි දින.

04-163

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/79866.
ඉඩම් කොමසාරිස්ගේ අංකය : HDLC/04/41/06/139.

21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 11 - මහසෙන්පුර ග්‍රාම නිලධාරි වසමේ මහසෙන්පුර ගමේ කැඩැස්තර සිතියම් 830077 හි කැබලි අංක 119 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්.0.2912 ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා මීගස්දෙනිය කංකානම්ගේ ගමික සඳමාල් මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

*උතුරට* : කැබලි අංක 59, 114 සහ 115,
*නැගෙනහිරට* : කැබලි අංක 114 සහ 115,
*දකුණට* : අ. භූ. පි. 02 හි කැබලි අංක 8270,
*බටහිරට* : අ. භූ. පි. 02 හි කැබලි අංක 8270 සහ මෙම පිඹුරේ කැබලි අංක 59.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2026.02.05 දින සිට වසර 30ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල .-* ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2026 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 50%ක් එකතු විය යුතුය.

*වාර මුදල* : ඉඩමේ වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

*දඩ මුදල* : ඉඩමේ නොදියුණු වාණිජ වටිනාකමින් 10% ක මුදලකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2026.02.05 දින සිට වසර 5ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහාවන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ජේ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මාර්තු මස 19 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-154

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78673.
*ඉඩම් කොමසාරිස්ගේ අංකය* : LCD/1/2/4/2-15.

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 11 - මහසෙන්පුර ග්‍රාම නිලධාරි වසමේ මහසෙන්පුර ගමේ කැඩැස්තර සිතියම් 830077 හි කැබලි අංක 40 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1299 ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා බුලත්සිංහල දම්මික බීඩී කුරේ මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 33, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 41 හා අ. භූ. පි. 02 හි කැබලි අංක 8137, |
| *දකුණට* | : අ. භූ. පි. 02 හි කැබලි අංක 8137 සහ කැබලි අංක 39, |
| *බටහිරට* | : කැබලි අංක 39 සහ 33. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2026.02.05 දින සිට වසර 30ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2026 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 50%ක් එකතු විය යුතුය.

*වාර මුදල* : ඉඩමේ වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

*දඩ මුදල* : ඉඩමේ නොදියුණු වාණිජ වටිනාකමින් 10% ක මුදලකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2026.02.05 දින සිට වසර 5ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදුගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2026 මාර්තු මස 19 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.